# ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
# ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி
# SRI LANKA FREEDOM PARTY


සභාපති : මෛත්‍රීපාල සිරිසේන
தலைவர் : மைத்திரிபால சிறிசேன
President : Maithripala Sirisena

ප්‍රධාන ලේකම් : [redacted]
பிரதான செயலாளர் :
Secretary :

භාණ්ඩාගාරික : නීතිඥ දුෂ්මන්ත මිත්‍රපාල
பொருளாளர் : துஷ்மந்த மித்ரபால (சட்டத்தரணி)
Treasurer : Dushmantha Mithrapala (Attorney-at-Law)


2024-03-20

**ගරු කථානායකතුමා**
**මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

ගරු කථානායකතුමනි,

**<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙන් (COPE) ඉල්ලා අස්වීම.</u>**

09 වෙනි පාර්ලිමේන්තුවේ 05 වැනි සැසිවාරයේ පාර්ලිමේන්තු කටයුතු වෙනුවෙන් වන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙකු ලෙස මා තෝරාපත් කරගැනීම පිළිබඳව ප්‍රථමයෙන්ම ඔබතුමන්ට ස්තූතියිවන්ත වෙමි.

පසුගිය ඉතිහාසය තුළ අප රට පාලනය කළ නොයෙක් රජයන් විසින් දියත්කරන ලද යහපත් වැඩපිළිවෙල සහ නොයෙක් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වුවද, එහි සාර්ථක ප්‍රතිඵල ජනතාව බලාපොරොත්තු වූ ආකාරයටම ඉටු නොවීම හේතුවෙන් පසුගිය එම කාල වකවානු තුළ පාලන තන්ත්‍රයේ සහ රටෙහි එක් එක් ක්ෂේත්‍රයන්ගේ අඩුපාඩු පෙන්වාදෙමින් එම අඩුපාඩු නිවැරදි කර ගනිමින් රට නිවැරදි මාර්ගයට යොමුකරගැනීම සඳහා පක්ෂ - විපක්ෂ, උගත් - බුද්ධිමත් තරුණ තරුණියන්ගේ අරගල ක්‍රියාවලිය තුළ ඉදිරිපත් වූ රටට හිතදායි ජනතාව බලාපොරොත්තු වන නව ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට (System Change) මම ද එකඟ වෙමි.

අප රටෙහි අනාගත දුවා දරුවන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් කඩිනමින් වෙනස්කළ යුතු දෑ වෙනස් කළ යුතු බව ද පසුගිය කාලවකවානුව තුළ රටේ ජනතාවට පාර්ලිමේන්තුව පිළිබඳ ගිලිහී ගිය විශ්වාසය නැවත වතාවක් ජනතාවගේ පරමාධිපත්‍ය පිළිබිඹු කරන ආයතනය ලෙස, විනිවිද භාවයකින් මෙන්ම වගකීම සහ වගවීම යන සිද්ධාන්ත මූලික කරගත් ජනතාවාදී ආයතනයක් ලෙස ආදර්ශයක් රටේ ජනතාවට ලබාදිය යුතු බව තරයේ සිහිපත් කරමි.

එබැවින් ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව තුළ රටේ ජනතාව බලාපොරෙත්තු වන විනිවිද භාවය පිළිඹිබු නොවීම හේතුකොට ගෙන එම සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමට මා තීරණය කළ බව මෙයින් ඔබතුමාට දන්වා සිටිමි.

<u>ජය ශ්‍රී මහාබෝ සමිඳු පිහිටයි !</u>

**දුමින්ද දිසානායක**
අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී
ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ජාතික සංවිධායක


301, ටී.බී. ජයා මාවත, කොළඹ 10. 301, டி.பி. ஜயா மாவத்தை, கொழும்பு 10. 301, T.B. Jayah Mawatha, Colombo 10.
දුරකථන தொலைபேசி Tel: +94 011 2680125, +94 011 2680126, +94 011 2680127, +94 011 2680128, +94 011 3138118
ෆැක්ස් தொலைநகல் Fax: +94 011 2680187 විද්‍යුත් තැපෑල : E-mail: slfphqrs@gmail.com